# (ඊ) රජයේ මුදල් පරිහරණය

**1960 – 61 මුදල් වර්ෂය:**

1960 ඔක්තෝබර් සිට 1961 සැප්තැම්බර් තෙක් වූ මුදල් වර්ෂ සඳහා ලංකාණ්ඩුවේ ගිණුම් සාරාංශය, කලින් වර්ෂයන්හි අනුරූප සංඛ්‍යා තොරතුරු ද සමග II—42 සටහනෙහි දැක්වේ. මේ සංඛ්‍යා සටහනේ දක්වා ඇති පරිදි, අය-වැය ලේඛන ගනුදෙනු වල ප්‍රධාන ලක්ෂණ මෙසේය.

(අ) 1960 – 61 මුළු ආදායම රුපියල් කෝටි 151·39 ක් විය. මෙය 1959 – 60 දී රුපියල් කෝටි 140·38 ක් සහ 1958 – 59 දී රුපියල් කෝටි 133·04 ක් විය.

(ආ) 1960 – 61 සම්මත කළ මුළු වියදම රුපියල් කෝටි 195·4 ක් විය. මෙය 1959 - 60 දී රුපියල් කෝටි 182.0 ක් සහ 1958 – 59 දී රුපියල් කෝටි 173·8 ක් විය. මේ සම්මත වියදම් සංඛ්‍යාවනට නිදන් අරමුදල් දායක දීමනා හා පොත් ගැලපිලි ඇතුලත් නොවේ. 1959–60 සංඛ්‍යාවනට මහ බැංකුවෙන් විශේෂ ණයක් වශයෙන් ලබාගෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගෙවන ලද රුපියල් කෝටි 3·7 ක දායක දීමනාව ඇතුලත් නොවේ.

(ඇ) 1960 – 61 දී අත්තිකාරම් ගිණුම් ගනුදෙනු හේතුකොට රුපියල් කෝටි 1·42 ක (ශුඩ) ගෙවීමක් ඇති විය. 1959 - 60 දී මෙය රුපියල් කෝටි 0·13 ක් සහ 1958 – 59 දී රුපියල් කෝටි 0·58 ක් විය.

(ඈ) මෙම ආදායම් සහ වියදම් අනුව 1960 – 61 මුදල් වර්ෂයේදී රජයට රුපියල් කෝටි 45·43 ක (ශුඩ) අයවැය හිඟයක් විය. 1959 – 60 හිඟය රුපියල් කෝටි 41·75 ක් වූ අතර 1958 – 59 හිඟය රුපියල් කෝටි 41·34 ක් විය.

අය වැය ලේඛනයෙන් ඇස්තමේන්තු කළ මුල් අය වැය හිඟය රු: කෝටි 32.61 * ක් වුවද නියම වශයෙන් වූ අය වැය හිඟය රුපියල් කෝටි 45·43 ක් වීමෙන් එය ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා රුපියල් කෝටි 12·81 කින් වැඩි විය.

නියම වශයෙන් ඇතිවූ හිඟයත් ඇස්තමේන්තු කළ හිඟයත් අතර වෙනසට ප්‍රධාන හේතුව නියම වශයෙන් ලද ආදායම මුලින් ඇස්තමේන්තු කළ ආදායමට වඩා රුපියල් කෝටි 12·0 කින් අඩුවීමය. මෙම හිඟය ඇතිවූයේ ප්‍රධාන වශයෙන්ම 1960 – 61 අයවැය ලේඛනයෙන් පැනවූ අළුත් බදු වලින් ලද ආදායම අඩුවීමෙනි. වියදම් ද මුල් ඇස්තමේන්තු වලට වඩා රුපියල් කෝටි 0·81 කින් වැඩිවිය.

1960 – 61 දී වූ මෙම අත්දැකීම එක් අතකින් ඉහත මුදල් වර්ෂ දෙකේ අත් දැකීම් වලට වඩා හාත්පසින්ම වෙනස්ය. 1959 – 60 දී මෙන්ම 1958 – 59 දී ද නියම හිඟය මුල් ඇස්තමේන්තු හිඟයට වඩා වැඩි විය. එහෙත් මෙම දෙවර්ෂයේදීම එම වැඩිවීමට හේතුවූයේ වර්තන වියදම මුල් ඇස්තමේන්තුවට වඩා බොහෝ සෙයින් වැඩිවීමය. 1959 – 60 දී මෙන්ම 1958 – 59 දී ද නියම ආදායම මුල් ඇස්තමේන්තු වලට වඩා වැඩිවිය. 1960 – 61 දී අය වැය බලාපොරොත්තු ඉටු නොවීමට හේතු වූයේ ඇස්තමේන්තු කළ ආදායම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීමය. මෙය මෑත වර්ෂවලදී ලද අත්දැකීම් වලින් පරිබාහිර වූවකි.

1958 – 59 දී සහ 1959 – 60 දී නියම ප්‍රාග්ධන වියදම් මුල් ඇස්තමේන්තුවලට වඩා සැලකිය යුතු ලෙස පහළ වැටී ඇති බවක් හෙළිවෙයි. 1960 – 61 මුල් ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවල 25% ක ඌනන වියදමකට ඉඩ සලසා ඇති අතර, නියම වියදමෙහි වූයේ මඳ අඩුවෙකි.

---

* 1960 – 61 අයවැය ලේඛන කථාවෙන් ප්‍රකාශ කැරුණ හිඟය, රුපියල් කෝටි 34.0 ක් විය. කමිටු අවස්ථාවේදී එක් කැරුණ වියදම් සමග පාර්ලිමේන්තුවෙන් සම්මත වූ මුල් අය වැය ලේඛනයේ ඇස්තමේන්තු කළ හිඟය රුපියල් කෝටි 36·23 කි. ශුඩ අයවැය හිඟය වූ රුපියල් කෝටි 32·62 ගණන් බලා ඇත්තේ නිදන් අරමුදල් දායක දීමනා වශයෙන් ඇස්තමේන්තු කර ඇති රුපියල් කෝටි 3·61 ක මුදල මේ සංඛ්‍යා වලින් අඩු කිරීමෙනි.

**ආදායම**:

1960 – 61 රජයේ මුළු ආදායම රුපියල් කෝටි 151·39 ක් විය. මෙය 1959 – 60 නියම මුළු ආදායමට වඩා රුපියල් කෝටි 11·01 කින් වැඩිය. මෙම වැඩිවීමට ප්‍රධාන හේතුන් වූයේ ආනයන බදු ආදායම් හා පෞද්ගලික බදු වලින් ලද ආදායම් වැඩිවීමය. 1960 – 61 අය වැය ලේඛනයෙන් පැනවුන ඉඩම් බද්ද ද මෙයට තව හේතුවක් විය.

1960/61 ආදායමෙහි ඇති වූ ප්‍රධාන වෙනස්කම් 1959/60 කැරුණ නියම වියදම් සහ 1960/61 මූල් ඇස්තමේන්තු සමග සසඳ පහත දක්වා ඇත.

සංඛ්‍යා සටහන II—41

රුපියල් දශ ලක්ෂ

| | මූල් ඇස්තමේන්තු 1960/61 | නියම 1960/61 | නියම 1959/60 |
|---|---|---|---|
| 1. අපනයන බදු (තේ බද්ද ඇතුළුව .. .. | 337·7 | 303·6 | 325·2 |
| (අ) තේ (තේ බද්ද ඇතුළුව) .. .. .. | 218·3 | 213·4 | 1218·0 |
| (ආ) රබර් (රබර් අපනයන අවසර පත්‍ර ගාස්තුව අත්හැර) .. .. .. .. | 80·0 | 54·3 | 79·7 |
| (ඇ) පොල් .. .. .. .. | 33·6 | 30·4 | 25·7 |
| 2. ආනයන බදු .. .. .. .. | 430·9 | 435·3 | 406·5 |
| 3. ආදායම් බද්ද (අධි භාරය ඇතුළත් නොවූ) .. | 205·0 | 229·9 | 189·5 |
| අධි භාරය .. .. .. .. | 30·0 | 28·9 | — |
| 4. පෞද්ගලික බදු, ධන, වියදම් හා පරිත්‍යාග .. | 19·0 | 11·8 | 1·2 |
| 5. 1960–61 අයවැය ලේඛනයෙන් පැන වූ අළුත් බදු .. .. .. .. | 93·0 | 17·1 | — |
| (අ) ඉඩම් බද්ද .. .. .. .. | 15·0 | 7·9 | — |
| (ආ) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ බද්ද .. | 50·0 | 3·3 | — |
| (ඇ) කොටස් ප්‍රාග් ධන බද්ද .. .. | 10·0 | 2·4 | — |
| (ඈ) වෘත්තීය බද්ද .. .. .. .. | 3·0 | ... | — |
| (ඉ) "වීසා" බද්ද .. .. .. .. | 15·0 | 3·5 | — |

සංඛ්‍යා -ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

මූල් ඇස්තමේන්තු වලින් බලාපොරොත්තු වූවාට වඩා අපනයන බදු ආදායම රුපියල් කෝටි 3·41 කින් අඩු විය. ආදායම අඩු වූයේ රබර් වලින් (රුපියල් කෝටි 2·57) තේ (රු කෝටි 0·49) සහ පොල් (රුපියල් කෝටි 0·32) වලිනි. පොල් සහ රබර් මිල පහළ වැටීම නිසා මේවායේ අපනයන බද්ද අවුරුද්ද තුළ අඩු කරන ලදී. 1960 නොවැම්බර් මාසයේදී රබර් අපනයන බද්ද රාත්තලකට ශත 38 සිට ශත 30 දක්වා ද, 1961 පෙබරවාරි මාසයේදී නැවත ශත 20 දක්වා ද අඩු කැරිණි. කොප්පරා, පොල්තෙල්, හා කපාපු පොල්, ටොන් එකක අපනයන බද්ද 1961 මැයි 22 ද, සිට පිළිවෙලින් රුපියල් 245 සිට රුපියල් 185 ට ද රුපියල් 185 සිට රුපියල් 140 ට ද රුපියල් 140 සිට රුපියල් 100 ට ද අඩු කැරිණි.

1960 – 61 ආනයන බදු වලින් රුපියල් කෝටි 43·53 ක් ලැබිණි. මෙය මේ මාර්ගයෙන් ලැබෙතැයි ඇස්තමේන්තු කළ ආදායමට දළ වශයෙන් සමාන වන අතර, 1959 – 60 මෙහින් ලද ආදායමට වඩා රුපියල් කෝටි 2·88 කින් වැඩිය. 1959 – 60 මුදල් වර්ෂයට වඩා ආනයන බදු ආදායම වැඩිවීමට හේතු වූයේ ප්‍රධාන වශයෙන්ම රෙදිපිළි, (රුපියල් කෝටි 1·05 ක්) මෝටර් ස්ප්‍රිතු හා ද්‍රව ඉන්ධන (රුපියල් කෝටි 1·87) දුම්කොළ හා සිගරැට් (රුපියල් කෝටි 0·38) හා අනෙකුත් භාණ්ඩ (රුපියල් කෝටි 0·87) ආනයන බදු ආදායම වැඩිවීමය. රථ වාහන උපකරණ ආනයන බදු වලින් ලැබුන ආදායම 1959 – 60 දීට වඩා රුපියල් කෝටි 0·85 කින් අඩු විය. පසුගිය මුදල් වර්ෂය අවසානයේදී, එනම්, 1960

සංඛ්‍යා සටහන II—42

## රජයේ ශුද්ධ අය වැය

| | 1951–52 | 1952–53 |
|---|---|---|
| 1. ශුද්ධ අය වැය අතිරික්තය හිඟය (—) .. .. .. .. | — 257·1 | — 231·9 |
| (අ) ආදායම .. .. .. .. .. .. | 954·0 | 952·5 |
| (ආ) වියදම, එනම් ණය ගැනීම් හෝ ණය දීම් ගනුදෙනු වල ශුද්ධ ලැබීම හෝ ගෙවීම් (ශුද්ධ) .. .. | —1,211·1 | 1,184·4 |
| (1) වර්තන වියදම (නිදන් අරමුදල් දායක දීමනා හා ආදායමෙන් ගෙවන අවශ්‍ය රාජ්‍ය ණය බේරීම් හැර) (2) ආ (1) බලන්න*) .. .. .. | —1,004·6 | — 893·5 |
| (ආහාර ආධාර) .. .. .. .. | (247.8) | (127.0) |
| (2) ප්‍රාග්ධන වියදම් .. .. .. .. | — 203·0 | — 220·6 |
| (3) ජාතික සංවර්ධන සංචිතයට අය වෙන වියදම | — 7·7 | — 6·4 |
| (4) ගබඩා තොග හා උපකරණ ගිණුමට අත්තිකාරම් .. | — 16.8 | — 2·4 |
| (5) අනොතුත් අත්තිකාරම්* .. .. .. | 19.0 | — 52·8 |
| (6) විවිධ .. .. .. .. .. | 2·0 | — 8·7 |
| **හිඟය පියවීම** | | |
| 2. රජයේ ණය ගැනීම් හා ණයදීම් ගනුදෙනුවලින් උද්ගත වන ලැබීම් හා ගෙවීම් (—) (ශුද්ධ) .. .. .. .. | 184·1 | 216·5 |
| (අ) පාලන ණය ගැනීම් හා ණය ගෙවීම් (විවිධ කටයුතු සඳහා ගත් ණය ඇතුළුව) .. .. .. | — 34·2 | 11·9 |
| (1) තැන්පතු (තඩුකියන්නන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන් යනාදීන්ගෙන් හා වියදම් නොකොට ඉතිරි වී ඇති විදේශාධාර) .. .. .. .. | — 16·2 | 21·4 |
| (2) විවිධ අරමුදල්, (වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදල, රජයේ සේවකයන්ගේ අර්ථ සාධක අර මුදල ආදිය.) .. .. .. .. .. | — 0·6 | — 0·2 |
| (3) විවිධ ණය (කාර්මිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනයට, ප්‍රාදේශිය ණය හා සංවර්ධන අරමුදලට, පළාත් පාලන මණ්ඩල ආදියට.) .. .. .. | 18·6 | — 9·3 |
| (ආ) දේශීය වෙළෙඳ ණය ගැණුම් හා ගත් ණය ආපසු ගෙවීම් .. .. .. .. .. | 218·3 | 204·6 |
| (1) රුපියල් ණය .. .. .. .. | 102·4 | 80·0 |
| —නිදන් අරමුදල් දායක දීමනා හා ආදායමෙන් ගෙවන අවශ්‍ය රාජ්‍ය ණය බේරීම් .. .. | 18.4 | 23·1 |
| | 84·0 | 56·9 |
| (2) භාණ්ඩාගාර බිල්පත් .. .. .. | 62·3 | 90·6 |
| (3) මහ බැංකු අත්තිකාරම් .. .. .. | 72·0 | — 1.5 |
| (4) බදු සංචිත සහතික .. .. .. .. | — | — |
| (5) අනොතුත්† .. .. .. .. .. | — | 58·6 |
| (ඇ) විදේශිය ණය ගැනීම් .. .. .. .. | — | — |
| 3. මුදල් ශෙෂයන්ගේ වෙනස්වීම් (පහසුවෙන් මුදල් කළ හැකි වත්කම් ඇතුළුව) .. .. .. .. .. | — 73·0 | — 15·4 |

*1960-61 අය වැය ඇස්තමේන්තුවල "ආදායමට අයවෙන වියදම්" සහ "ණය අරමුදල්වලට අය වෙන වියදම්" යනුවෙන් වියදම් වගී කිරීමේ මෙතෙක් පැවති ක්‍රමය අත්හැර, ඒ වෙනුවට රජයේ මුළු වියදම්, පෞද්ගලික වැටුප්, පරිපාලන වියදම්, දෙපාර්තමේන්තු විසින් සැපයෙන සේවා, ආර්ථික සංවර්ධනය යන සිසින් කොටස්කතරකට බෙදන ලදී. පසුව දක්වන ලද එක් එක් වගීය වර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් නැවත දෙවගීයකට බෙදන ලදී. මෙසේ රජයේ මුළු වියදම ශීෂී හතකට බෙදා දක්වා ඇත. මේ සටහනෙහි, වැය ශීෂී 1, 2, 4 හා 6 යටතේ දක්වා ඇති පෞද්ගලික වැටුප් සහ වර්තන වියදම් ද වැයශීෂී 3, 5, හා 7 යටතේ ප්‍රාග්ධන සඳහා වූ මුළු වියදම ද වර්තන වියදම් හා ප්‍රාග්ධනවියදම් වශයෙන් වෙන්කොට දක්වා ඇත. 1960–61 වර්ෂය සඳහා මෙවැනි වර්ග කිරීමෙක් නොමැති නිසා, ආදායමට අයවෙන වියදම් හා ණය අරමුදල් වලට අයවෙන වියදම් වෙන වෙනම වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වලට සමානවෙතැයි සලකනු ලැබේ.

ගතවූ මුදල් වර්ෂ වලදී වැය වූ ණය කාර්යයන් සඳහා අත්තිකාරම් ගිණුම්හි පාඩු 'වර්තන වියදමට' හා ප්‍රාග්ධන වියදමට මාරුකිරීමෙන් උද්ගතවන පොත් ගැලපිලි (හර සහ බැර) අත්හැර ඇත. එබැවින් ලංකාණ්ඩුවේ ගිණුම්වල සංඛ්‍යාවන් හා මෙහි සංඛ්‍යාවන් නොසැසඳේ.

## අතිරික්තය හෝ හිඟය (—)

රුපියල් දශ ලක්‍ෂ

| | 1953-54 | 1954-55 | 1955-56 | 1956-57 | 1957·58 | 1958-59 | 1959-60 | 1960-61(ඇ) |
|---|---|---|---|---|---|---|---|---|
| | 33·7 | 127·6 | — 1·2 | — 196·4 | — 222·3 | — 413·4 | — 417·5 | — 454·3 |
| | 1,026·2 | 1,158·6 | 1,257·2 | 1,260·5 | 1,280·0 | 1,330·4 | 1,403·8 | 1,513·9 |
| | — 992·5 | — 1,031·0 | — 1,258·4 | — 1,456·9 | — 1,502·3 | — 1,743·8 | — 1,821·3 | — 1,968·2 |
| | — 772·0 | —864·9 (අ) | — 1,014·4 | — 1,105·2 | — 1 280·1 | — 1,432·2 | -1,511·9(ආ) | 1,540·8 |
| | (12.0) | (36.0) (අ) | (79.5) | (105.5) | (112.0) | (146.5) | (193.0) | (248.0) |
| | — 162·3 | — 215·5 | — 211·0 | — 213·3 | — 282·6 | — 303·4 | — 306·6 | — 411·7 |
| | — 3·2 | — 2·1 | — 4·0 | — 5·1 | — 3·0 | — 2·4 | — 1·5 | — 1·5 |
| | 4·6 | 9·9 | 1·2 | — 14·5 | ... | 10·5 | — 7·1 | 1·9 |
| | — 61·1 | 34·0 | — 30·3 | — 115·8 | 54·5 | — 17·1 | 5·8 | — 15·9 |
| | 1·5 | 7·6 | 0·1 | — 3·0 | 8·9 | 0·8 | ... | — 0·2 |
| | — 35·3 | — 39·0 | 12·2 | 175·4 | 174·7 | 351·8 | 411·6 | 454·3 |
| | — 4·6 | 29·1 | — 36·5 | — 9·4 | 72·5 | 27·6 | 57·4 | 34·5 |
| | — 2·1 | 34·5 | — 10·8 | 9·0 | 73·9 | 27·3 | 62·3 | 41·6 |
| | 0·3 | — 0·9 | — 4·8 | — 2·3 | 20·1 | 4·2 | 2·7 | — 1·0 |
| | — 2·8 | — 4·5 | — 20·9 | — 16·1 | — 21·5 | — 3·9 | — 7·6 | — 6·1 |
| | — 94·0 | — 80·2 | 43·5 | 166·2 | 78·5 | 288·7 | 324·9 | 403·5 |
| | 70·0 | 75·0 | 74·5 | 94·9 | 45·0 | 95·0 | 134·8 | 214·9 |
| | 22.6 | 44.5 | 39.0 | 31.1 | 26.5 | 3·22 | 33.3 | 35.1 |
| | 47·4 | 30·5 | 35·5 | 63·8 | 18·5 | 62·8 | 101·5 | 179·8 |
| | — 78·1 | — 44·9 | 8·0 | — 3·0 | 74·6 | 179·0 | 228·2 | 198·4 |
| | — 4·7 | — 65·8 | — | 96·3 | — 13·8 | 41·1 | 3·1(ආ) | 20·6(ආ) |
| | — | — | — | 9·1 | — 0·8 | 5·8 | — 7·9 | 4·7 |
| | — 58·6 | — | — | — | — | — | — | — |
| | 63·3 | 12·1 | 5·2 | 18·6 | 23·7 | 35·5 | 29·3 | 16·3 |
| | — 1·6 | 88·6 | 11·0 | — 21·0 | — 47·5 | — 61·7 | — 6·0 | ... |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

†අර්ධ රාජ්‍ය නියෝජ්‍යත්වයන්ගෙන් ගත් ණය.

(අ) 1954-55 ගේ ආහාර ආධාර සඳහා වූ රුපියල් කෝටි 3·6 මුදලක් අත්තිකාරම් ගිණුමේ සිට ආදායමට අය වෙන වියදමට මාරු කරන ලදී. මේ පොත් ගැලපිල්ල 1958-59 සංඛ්‍යාවන්ගෙන් ඉවත් කර තිබුන ද, (*සංලක්‍ෂ්‍යය බලන්න.) 1954-55 සංඛ්‍යාවන් එය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කර ඇත

(ආ) බ්‍රෙටන්වුඩ් ගිවිසුම් පනත යටතේ මහ බැංකුවෙන් ලබා ගත් විශෙෂ ණය මුදලකින් ගෙවන ලද රුපියල් කෝටි 3·7 ක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට වැඩිකළ දායක දීමනාව අත් හැර ඇත

(ඇ) තාවකාලිකයි

අගෝස්තු මාසයේදී ආනයන වගී රාශියක් සඳහා තීරු බදු වැඩි කළ අතර, රෙදි පිළි හා ඔර්ලෝසු සඳහා පරිමා සීමාවන් ද පනවන ලදී. 1961 ජනවාරි මාසයේදී මේ විධිවිධාන තවත් දැඩි කළේ ආහාර ද්‍රව්‍ය හැර සියලුම ආනයනයන් සඳහා 5%ක ආනයන බද්දක් පැනවූ අතර, බොහෝ භාණ්ඩ සඳහා පරිමා සීමා පනවනලදී.

1959-60 දී ආදායම් බද්දෙන් ලද ආදායම වැඩිවීම (අධිභාරය හැර) 1958 සහ 1959 අතර කාලයේ අපනයන ආදායමෙහි (අපනයන ගාස්තු අඩුකොට) ඇති වූ දියුණුව පෙන්නුම් කැරේ. දේශීය අංශයේ ආදායම වැඩිවීමද මෙයට හේතුවූවා විය හැකිය.

1960 – 61 අයවැය ලේඛනයෙන් පනවන ලද අලුත් බදුවලින් නියම වශයෙන් ලද ආදායමත් ඇස්තමේන්තු කළ ආදායමත් අතර ඇති වූ සැලකියයුතු වෙනස ප්‍රධාන වශයෙන්ම ව්‍යවස්ථා පිළිබඳ වූ පමාවන් නිසා ඇති විය. සාමාන්‍ය යෙන් ජූලි මාසයේදී පාර්ලිමේන්තුවට අයවැය ලේඛනය ඉදිරිපත් කළ ද නව රජය ජූලි අගදී පත්වීම නිසා 1960 - 61 අයවැය ලේඛනය සැප්තැම්බර් මාසය දක්වා පමා විය. තවද අලුත් බදු පැරණි ක්‍රමයෙන් වෙනස් වූ නිසා අළුත් ව්‍යවස්ථා පැනවීමට අවශ්‍ය විය. බොහෝ බදු සම්බන්ධයෙන් ව්‍යවස්ථා සම්පූර්ණ වූයේ මුදල් වර්ෂයේ අවසාන කොටසේදීය. එසේම ප්‍රථම වරට පැනවූ බදු සම්බන්ධ-යෙන් නිවැරදි ඇස්තමේන්තු සැකසීම ද ප්‍රශ්නයකි.

**වර්තන වියදම**

1958 – 59 සිට 1961 – 62 දක්වා වූ වර්ෂවල වර්තන හා ප්‍රාග්ධන වියදම පිළිබඳ විස්තර පහත සටහනින් දැක්වේ.

සංඛ්‍යා සටහන II—43

**ලංකාණ්ඩුවේ වියදම**

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | වර්තන වියදම (1) | ප්‍රාග් ධන වියදම (2) | | |
|---|---|---|---|---|
| | | මූර්තවත්කම් අත්කර ගැනීම, නිර්මාණය සහ පවත්වා ගෙන යාම | රාජ්‍ය නියෝජ්‍යත්ව-යන්ට දුන් ණය. | එකතුව |
| 1958 - 59 .. .. .. | 1,274·4 | 443·2 | 49·8 | 493·0 |
| 1959 - 60 .. .. .. | 1,365·4 | 440·1 | 55·6 | 495·7 |
| 1960 - 61 (මුල් ඇස්තමේන්තු) .. | 1,464·0 | 503·5 | 19·4 | 522·9 |
| (නියම තාවකාලික) .. | 1,480·7 | 464·7 | 50·7 | 515·4 |
| 1961 - 62 (මුල් ඇස්තමේන්තු) .. | 1,450·3 | 580·6 | 59·9 | 640·5 |

සංඛ්‍යා-ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

(1) වර්තන වියදම ලබාගන්නේ මුළු ආවර්තන වියදමින් (1, 2, 4 සහ 6 වැය ශීර්ෂ) නිදන් අර මුදල් දීමනාව සහ ප්‍රාග්ධන ස්වරූපීය වියදම් (පවත්වාගෙන යාමේ වියදම් සහ කල් පවත්නා භාණ්ඩ මිලට ගැනීම) අඩු කිරීමෙනි.

(2) ප්‍රාග්ධන වියදම් ලෙස සැලකෙන්නේ, අවුරුද්දකට වඩා වැඩි කාලයක ප්‍රයෝජනය සඳහා වත්කම්, නිර්මාණය, ලබා ගැනීම, හා පවත්වා ගෙන යාම සඳහා යන වියදම් සහ මූල්‍ය වත්කම් අත්කර ගැනීමේ වියදම්ය. මෙයට ප්‍රධාන වශයෙන් ලං. ග. ම. යට හා වරාය සංයුක්ත මණ්ඩලය (ප්‍රාග්ධන කායකියන් සඳහා)හා කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන සමායතනය (සංවර්ධන ණය අරමුදල) ආදියට දෙන ලද ණය මුදල් ගැනේ. සංවර්ධනයට නොගැනෙන ප්‍රාග්ධන වියදම් ඇතුළත් වන නිසාත්, සංවර්ධනයට ගැනෙන සමහර වියදම් ඇතුළත් වන නිසාත් ප්‍රාග් ධන වියදම් සංවර්ධන වියදම් හා සැසැඳෙන්නේ නොවේ. ප්‍රාග් ධන වියදම් වලට ප්‍රාග් ධන වැය ශීර්ෂ (3, 5 සහ 7) යටතේ ගැනෙන වියදම්, ජා: ප්‍ර: ස: බැ: ණය වැනි විදේශීය ණය සඳහා වන වියදම් වර්තන වියදම් වල ප්‍රාග්ධන ශීර්ෂ, තේ හා රබර් නැවත වගා කිරීමේ ආධාර, විදුලි දෙපාර්තමේන්තුවේ සංචිත වියදම්, විදේශාධාර වියදම් ආදී, අධි අය - වැය ලේඛන වියදම් ගැනේ. අධි අය - වැය ලේඛන වියදම් 1958 - 59 කෝටි 2. 93, 1959 - 60 කෝටි 3·89, 1960 - 61 කෝටි 2·36, (අ.ස්තමේන්තු) කෝටි 4·23 (තාවකාලික) 1961-62 කෝටි 3·36

1959 - 60 සංඛ්‍යාව හා සසඳන විට 1960 - 61 නියමම වර්තන වියදම (තාවකාලික සංඛ්‍යා) රුපියල් කෝටි 11·53 කින් වැඩි වී ඇත. 1960 - 61 වියදම් වැඩි වූයේ ප්‍රධාන වශයෙන්ම ආහාර ආධාර (කෝටි 5·5 කින්) රාජ්‍ය ණය සඳහා පොළී ආදිය (රුපියල් කෝටි 1·68 කින්) හා විශ්‍රාම වැටුප් (රුපියල් කෝටි 0·58 කින්) සම්බන්ධයෙනි. ආහාර ආධාර වියදම රුපියල් කෝටි 19·3 සිට රුපියල් කෝටි 24·8 තෙක් ඉහළ ගියේය. ආහාර ආධාර වියදම වැඩි වූයේ සහතික මිල ක්‍රමය යටතේ මිලට ගත් වී ප්‍රමාණය වැඩිවීමත් සහල් සලාකයේ මිල අඩු කිරීමත් හේතුකොට ගෙනය. *

කලින් වර්ෂයේදී මෙන්ම බුරුමයෙන් ගෙන්වූ සහල් ටොන් එකක් මෙරටට ගොඩබෑමේදී රුපියල් 530/= ක් විය. ඇමරිකානු රාජ්‍ය නීති 480‡ යටතේ ගෙන්වන ලද තිරිඟු පිටි ටොන් එකක් මෙරටට ගොඩබෑමේදී සාමාන්‍ය මිල 1960 - 61 රුපියල් 500/= ක් වුවද 1961 - 62 දී එය රුපියල් 515/= තෙක් ඉහළ ගියේය. අනෙකුත් රටවලින් ගෙන්වූ පිටිවල මිල 1960 - 61 පමණටම විය. පිටි ගෙන්වන ප්‍රධාන රටක් වන ඕස්ට්‍රේලියාවෙන් ගෙන් වූ පිටි ටොන් එකක සාමාන්‍ය මිල රුපියල් 460/= ක ම පැවැතිණි.

1960 - 61 දී සහතික මිල ක්‍රමය යටතේ ගත් මුළු වී ප්‍රමාණය බුසල් 2,39,90,587 කි. සහල්වලින් මෙය ටොන් 3,26,272 ට සමානය. 1959 - 60 දී සහතික කළ මිල ක්‍රමය යටතේ රජය මිලට ගත් වී තොගය සහල් ටොන් 2,70,000 කට සමානය.

**ප්‍රාග්ධන වියදම.**

1960 - 61 ප්‍රාග්ධන වියදම (අධි අය වැය ලේඛන වියදම් ද ඇතුළුව) රුපියල් කෝටි 51·54 ක් වූයේ 1959 - 60 ප්‍රාග්ධන වියදමට වඩා රුපියල් කෝටි 1·97 කින් වැඩි විය. මූර්ත වත්කම් අත්කර ගැනීම, නිර්මාණය කිරීම හා පවත්වා ගෙන යෑම සඳහා වූ වියදම රුපියල් කෝටි 46·47 ක් විය. රාජ්‍ය නියෝජ්‍යතායනට දෙන ලද ණය රුපියල් කෝටි 5·07 ක් විය.

1959 - 60 දී මේ වෙනුවෙන් පිළිවෙළින් රුපියල් කෝටි 44·01 ක් හා රුපියල් කෝටි 5·56 ක් වැය විය. ලැබී ඇති සංඛ්‍යා තොරතුරු අනුව මෙම වැඩිවීම සිදු වී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම කෘෂිකර්ම, වාරි මාර්ග හා කර්මාන්ත යන ප්‍රාග්ධන වැය ශීර්ෂවලය.

---

* 1960 අප්‍රේල් 11 වැනි දිනට පෙරාතුව එක් අයෙකුට සතියකට දුන් සලාක සහල් සේරු දෙකෙන් මුල් සේරුවේ මිල ශත 25 ක් ද, දෙවැනි සේරුවේ මිල ශත 45 ක් ද විය. 1960 අප්‍රේල් 11 වැනිදා සිට දෙවැනි සේරුවේ මිල ද ශත 25 දක්වා අඩු කරන ලදී. එබැවින් සලාක සහල් සේරුවක සාමාන්‍ය මිල ශත 35 සිට 25 දක්වා පහළ වැටිණි.

‡ ඇමරිකා රාජ්‍ය නීති 480 යටතේ ලබා ගන්නා සහල් සහ පිටි සඳහා ගෙවිය යුත්තේ රුපියල් වලිනි. මෙසේ ගෙවන රුපියල් වලින් කොටසක් ලංකා රජයට දීමනාවක් වශයෙන් ලැබේ.

**අය වැය හිඟය පියවීම**

1960 – 61 අයවැය හිඟය පියවා ගැනීමට මුදල් ලබා ගත් මාර්ගයන් ද ඉන් ඇති වූ ශුද්ධ ප්‍රසාරණාත්මක බල පෑම ද කලින් වර්ෂයේ අනුරූප සංඛ්‍යා සමග පහත සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II—41

**හිඟය පියවූ ආකාරය**

රුපියල් දශ ලක්ෂ

| | 1959 - 60 | | 1960 - 61 (තාවකාලික සංඛ්‍යා) | |
|---|---|---|---|---|
| 1· පරිපාලන ණය ගැනුම් .. .. .. | | 57·4 | | 34·5 |
| 2· විදේශීය ණය ගැනුම් .. .. .. | | 29·3 | | 16·3 |
| 3· දේශීය වෙළෙඳ පොළෙන් බැංකු නොවන-ණය ගැනුම් .. | 117·1 | | 197·3 | |
| නිදන් අරමුදල් දායක දීමනා අත්හැර .. | - 33·3 | 83·8 | - 35·1 | 162·2 |
| 4· දේශීය වෙළෙඳ පොළෙන් ණය ගැනුම්-බැංකු ක්‍රමයෙන් .. | | 241·1 | | 241·4 |
| 5· රජයේ මුදල් ශේෂයන්හි අඩුවීම .. .. | | 6·0 | | — |
| 6· ශුද්ධ අය-වැයලේඛන හිඟය .. .. .. | | 417·5 | | 454·3 |
| 7· එක්සත් ජනපදයේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ගිණුමේ අඩුවීම (- ලකුණෙන් වැඩිවීමක් දැක්වේ.) .. | | 4·0 | | - 7·5 |
| 8· අය-වැය ලේඛනයේ ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම (4+5+7) .. .. | | 251·1 | | 233·9 |

සංඛ්‍යා-ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

මුදල් ඇමතිවරයා සිය අය වැය කතාවෙන් ප්‍රකාශ කළ පරිදි මුලින් ඇස්තමේන්තු ගත රුපියල් කෝටි 32·6 *ක ශුද්ධ අය වැය හිඟය පියවීම සඳහා දේශීය ණය ගැනීම් වලින් රුපියල් කෝටි 20·4* ක් සහ විදේශීය ආධාර වලින් රුපියල් කෝටි 10 0 ක් ලබාගැනීමට අපේක්ෂා කළේය. ඉහත සඳහන් දේශීය ණය ගැනීම් සංඛ්‍යාවනට වෙළෙඳ බැංකු මිලට ගත් දිගු කාලීන රුපියල් සුරැකුම් පත් ඇතුළත් කිරීම හැර අය වැය හිඟය පියවීම සඳහා ණය මවා ගැනීම සඳහා විධිවිධාන සලසා නොතිබිණි එහෙත් වර්තන වියදම මදක් වැඩිවීමත්, ආදායම හා විදේශීය ආධාර සැලකිය යුතු අන්දමින් පහළ වැටීමත් නිසා බැංකු ක්‍රමයෙන් 1959 60 ප්‍රමාණයටම ණය ගැනීමට සිදු විය.

බැංකු ක්‍රමයෙන් ගත් ණය ප්‍රමාණය රුපියල් කෝටි 24·14 ක් විය. මෙයින් රුපියල් කෝටි 22 24 ක්ම මහ බැංකුව හා වෙළෙඳ බැංකු ගත් භාණ්ඩාගාර බිල් පත් වලින් සමන්විත විය. මහ බැංකුවෙන් රජයට කෙළින්ම දුන් ණය රුපියල් කෝටි 2·06 ක් විය. මහ බැංකුව මිලයට ගත් භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 18·5 ක් විය වෙළෙඳ බැංකු රුපියල් කෝටි 3·73 ක භාණ්ඩාගාර බිල් පත් මිලයට ගන්නා ලදී ඔවුන් විසින් මිලයට ගන්නා ලද බදු සංචිත සහතික පත් ප්‍රමාණය රුපියල් කෝටි 0·13 ක් වූ අතර ඔවුන්ගේ රුපියල් සුරැකුම් පත් අයිතිය රුපියල් කෝටි0·15 කින් අඩුවිය.

* අය වැය කථාවේ දැක්වූ සංඛ්‍යා රුපියල් කෝටි 36·23 ක් සහ රුපියල් කෝටි 24·0 කි. රුපියල් කෝටි 32·62 හා රුපියල් කෝටි 20·4 රේ සංඛ්‍යා ලැබුණේ රුපියල් කෝටි 3·61 ක් වූ නිදන් අරමුදල් දායක දීමනා මෙයින් අඩු කිරීමෙනි. ඊට හේතුව ශුද්ධ අය වැය හිඟය ගණනය කිරීමේදී නිදන් අරමුදල් දායක දීමනා වියදමට ඇතුළත් නොකැරීමයි.

1959 – 60 දී වෙළෙඳ බැංකු රුපියල් කෝටි 0·48 ක භාණ්ඩාගාර බිල් පත් මිලයට ගත් අතර රුපියල් සුරැකුම් පත් රුපියල් කෝටි 0·21 කින් අඩු කැරිණි.

1960 – 61 දී රජයේ මුදල් ශේෂවල වෙනසෙක් නොවිණි. එක්සත් ජනපදයේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ගිණුමට බැර වශයෙන් නොගෙවා ඇති මුදල 1960 – 61 දී රුපියල් කෝටි 0·75 කින් වැඩි විය. 1960 වාර්ෂික වාර්තාවෙන් විස්තර කළ පරිදි මෙම වැඩිවීම රජයේ අය වැය ගනුදෙනු වල ශුඩ ප්‍රසාරණාත්මක බලපෑම ගුණනය කිරීමේදී, රජයේ මුදල් ශේෂ වැඩිවීමට සමාන කළ හැකිය.

ඉහත දක්වූ සංඛ්‍යා අනුව 1960 – 61 රජයේ අයවැය කටයුතු වල ශුඩ ප්‍රසාරණ බලපෑම රුපියල් කෝටි 23 39 ක් විය. 1959 – 60 අනුරූප සංඛ්‍යාව රුපියල් කෝටි 25·11 කි.

1959 – 60 හා 1960 - 61 යන අවුරුදු වල බැංකු නොවන දේශීය මාර්ගයන්-ගෙන් ලබාගත් ශුඩ ණය ප්‍රමාණයන් එකිනෙකට සැසැඳිය හැක්කේ නොවේ. ඊට හේතුව 1959 – 60 දී සාමාන්‍යයෙන් වෙළෙඳ පොළෙහි ආයෝජනය කැරෙන දෙපාර්තමේන්තු හා රජයේ නියෝජ්‍යත්වයන් සතු ප්‍රමාණවත් අරමුදල් අති රික්තයන් කෙළින්ම භාණ්ඩාගාරය විසින් ණයට ගෙන, පරිපාලන ණය ගැනීම් යටතේ ඉහත සඳහන් සටහනේ දක්වා තිබීමය. 1959 – 60 දී මෙය රුපියල් කෝටි 4 6 ක් වූ අතර 1960 – 61 දී රුපියල් කෝටි 0·33 ක් විය. මෙම සංඛ්‍යා සැලකිල්ලට ගෙන ගලපා බලන විට බැංකු නොවන දේශීය මාර්ගයන්ගෙන් 1959 – 60 දී රුපියල් කෝටි 12·78 ක් ද, 1960 – 61 දී රුපියල් කෝටි 16·52 ක්ද ණයට ගෙන ඇත. පසුගිය අවුරුද්දට වඩා මෙය රුපියල් කෝටි 3·6 කින් පමණ වැඩිය. වැඩි වූ දායක දීමනා ප්‍රධාන වශයෙන්ම ලැබුණේ වෙළෙඳ සමාගම්, ඉතිරි කිරීම් ආයතන, රක්ෂණ සමාගම්, සේවක අර්ථසාධක අරමුදල්, සමාජ සහ ආයතන වලිනි. රජයේ නව සුරැකුම් පත් සඳහා නිදන් අරමුදලින් වෂීය තුළ කැරුණ දායක දීමනා අඩු විය. සංගම් හා ආයතන 1959 – 60 දීට වඩා 1960 – 61 දී රුපියල් කෝටි 1·51 ක් දී ඇත. සේවක අර්ථසාධක මුදල 1960 – 61 දී 1959 – 60 දීට වඩා රුපියල් කෝටි 0·6 ක් රජයේ සුරැකුම් පත් වල ආයෝජනය කළේය. අර්ධරාජ්‍ය ඉතිරි කිරීම් ආයතන 1960 - 61 දී තමන් සතු රජයේ සුරැකුම් පත් රුපියල් කෝටි 2·28 කින් වැඩි කළේය. 1959 - 60 දී මෙය රුපියල් කෝටි 1 71 ක් විය. රක්ෂණ සමාගම් රජයට දුන් ණය ප්‍රමාණය 1959-60 දීට වඩා 1960 – 61 දී රුපියල් කෝටි 0·23 කින් වැඩි විය. අනෙකුත් සමාගම්වල සුරැකුම් පත් අයිතිය රුපියල් කෝටි 1.04 කින් වැඩි විය. 1959-60 දී මේ රුපියල් කෝටි 0·81 කින් අඩුකොට තිබිණි.

1960 - 61 දී ප්‍රාග්ධන වියදම් සඳහා ලත් විදේශීය ආධාර රුපියල් කෝටි 2·96 ක් විය. 1959 – 60 දී ලත් ප්‍රමාණය රුපියල් කෝටි 3·86 කි. ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණ රුපියල් කෝටි 2·96 න් රුපියල් කෝටි 1·63 ක් ණය වශයෙන් ලැබුණ අතර, රුපියල් කෝටි 1·33 ක් ආධාර වශයෙන් ලැබිණි. අවුරුද්ද තුළ ආපසු ගෙවන ලද විදේශීය ණය ප්‍රමාණය රුපියල් කෝටි 0·29 ක් විය.

**රාජ්‍ය ණය** (1)

දේශීය හා විදේශීය රාජ්‍ය ණය පිළිබඳ විස්තර 23 වැනි සටහනේ දක්වා ඇත. ( 1 පරිශිෂ්ටය බලන්න) පසුගිය මුදල් වර්ෂ පහේ එක් එක් මුදල් වර්ෂය අවසානයේදී වූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණයන් පහත දැක්වේ.

සංඛ්‍යා සටහන—11—45

**මුළු රාජ්‍ය ණය**

රුපියල් දශලක්ෂ

| සැප්තැම්බර් අවසානයේදී | දළ | ශුද්ධ (නිදන් අරමුදල් වටිනාකම් අඩුකොට) |
|---|---|---|
| 1957 .. .. .. .. | 1,363·9 | 1,123·3 |
| 1958 .. .. .. .. | 1,495·4 | 1,212·1 |
| 1959 .. .. .. .. | 1,837·0 | 1,524·7 |
| 1960 .. .. .. .. | 2,230·4 | 1,912·8 |
| 1961 .. .. .. .. | 2,651·0 | 2,332·7 |

සංඛ්‍යා ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

1960 – 61 වර්ෂයේදී දළ රාජ්‍ය ණය ප්‍රමාණය, රුපියල් කෝටි 42·06 කින් ද, ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් 41·99 කින් ද වැඩි විය. 1959 – 60 මේ ප්‍රමාණයන් පිළිවෙළින් රුපියල් කෝටි 39·35 ක් හා රුපියල් කෝටි 38·88 ක් විය. දළ රාජ්‍ය ණය රුපියල් කෝටි 42·06 කින් වැඩි වූයේ රුපියල් සුරැකුම් පත් රුපියල් කෝටි 17·98 කින් ද, භාණ්ඩාගාර බිල්පත් රුපියල් කෝටි 20·0 කින්ද මහ බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 2·28 කින් ද, බදු සංචිත සහතික රුපියල් කෝටි 0·47 කින් ද, විදේශීය ණය රුපියල් කෝටි 1·34 කින් ද වැඩි වීමෙනි.

**රුපියල් සුරැකුම් පත්**

පසුගිය පස් අවුරුද්ද තුළ ගත්තා ලද ණය සහ ගෙවන ලද ණය ප්‍රමාණය පහත සටහනේ දැක්වේ.

සංඛ්‍යා සටහන—11—46

(රුපියල්)

| මුදල් වර්ෂය | ගත්තා ලද ණය | ගෙවන ලද ණය |
|---|---|---|
| 1956 – 57 .. .. .. | 9,50,00,000 | 1,50,93,200 |
| 1957 – 58 .. .. .. | 7,94,74,400 | 5,61,43,700 |
| 1958 – 59 .. .. .. | 12,04,16,800 | 3,50,25,200 |
| 1959 – 60 .. .. .. | 19,50,00,000 | 5,52,39,200 |
| 1960 – 61 .. .. .. | 26,95,83,200 | 8,97,48,800 |

සංඛ්‍යා:– ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

1960 – 61 මුදල් වර්ෂය තුළ දී රුපියල් සුරැකුම් පත් නිකුතු 10 ක් විය. මෙයින් 1965 – 67, 3% ණය සහ 1981 – 85, $4\frac{1}{4}$% ණය රුපියල් කෝටි 3·52 ක් වූ 1955 – 60 කල් පිරෙන සියයට $2\frac{1}{2}$ ජාතික සංවර්ධන ණය මුදල් පුනරුයෝජනය සඳහා යොදවනු ලැබිය. පුනරුයෝජන කළ ප්‍රමාණය රුපියල් කෝටි 3·04 ක් විය. 1964 – 66, 3% නේ ණය ද 1982 – 86 සියයට $4\frac{1}{4}$ "ජී" කාණ්ඩයේ ණය ද, රුපියල් කෝටි 5 46 ක් වූ 1959 – 60, $3\frac{1}{2}$% ණයට හැරවීම සඳහා යොදනු ලැබීය. 1959 – 60 මේ ණය බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදලක් නොවිය.

(1) මේ රාජ්‍ය ණය සංඛ්‍යාවනට, රුපියල් කෝටි 7.0 ක ජාතික නිවාස ණයකර ඇතුලත් නොවේ.

සංඛ්‍යා සටහන II—47

**1960 - 61 රජයේ සුරැකුම් පත් බෙදී ගිය අයුරු**

රුපියල් දශලක්ෂ

| දායකයා | 3% 1965/67 ණය | | 4% 1981/85 ණය | | 4¼% 1981/85 'බී' කාණ්ඩය | 4¼% 1982/86 ණය | 4¼% 1982/86 'බී' කාණ්ඩය | 4¼% 1982/86 'සී' කාණ්ඩය | 4¼% 1982/86 'ඩී' කාණ්ඩය | 3% 1964/66 ණය | | 4¼% 1982/86 ණය 'ඊ' කාණ්ඩය | | 4¼% 1982/86 'එෆ්' කාණ්ඩයේ ණය | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුනරාප්‍රයෝජන* | මුදල් | පුනරාප්‍රයෝජන* | මුදල් | | | | | | පුනරාප්‍රයෝජන + | මුදල් | පුනරාප්‍රයෝජන + | මුදල් | | ප්‍රමාණය | % |
| වෙළෙඳ බැංකු .. .. | 9·2 | 1·2 | 18·9 | 1·4 | — | — | — | — | — | 2·5 | — | 2·3 | 0·5 | 2·0 | 38·0 | 14·1 |
| සමුපකාර ප්‍රාදේශීය බැංකු | — | — | — | — | 1·4 | 0·6 | — | — | — | — | — | 0·1 | 0·1 | — | 2·2 | 0·8 |
| ඉතිරි කිරීමේ ආයතන .. | — | — | 0·7 | 8·6 | 5·7 | 2·2 | 1·7 | 1·1 | 4·0 | — | — | 31·5 | 0·2 | — | 55·7 | 20·7 |
| නිදන් අරමුදල් .. .. | — | — | — | — | — | 6·7 | 16·5 | 7·2 | 7·0 | — | — | — | — | 6·7 | 44·1 | 16·4 |
| දෙපාර්තමේන්තු සහ රජයේ අනෙකුත් ණය .. | — | 1·0 | — | 1·2 | 1·4 | 1·1 | ... | 1·6 | 0·3 | — | — | 0·6 | — | 0·2 | 7·4 | 2·7 |
| භාරකාර, අර්ථ සාධක සහ විශ්‍රාම අරමුදල් | | | | | | | | | | | | | | | | |
| 1. සේවක අර්ථ සාධක අරමුදල .. | — | — | — | 5·1 | 6·7 | 6·8 | 9·3 | 9·0 | 7·4 | — | 0·2 | 3·3 | 1·1 | 7·7 | 56·6 | 21·0 |
| 2. අනෙකුත් .. | 0·1 | 1·5 | 0·1 | 6·4 | 5·7 | 5·7 | 2·2 | 3·8 | 5·2 | 0·1 | — | 1·4 | 1·0 | 1·5 | 34·7 | 12·9 |
| රක්ෂණ සමාගම් .. .. | — | 0·4 | ... | 0·6 | 3·8 | 1·3 | 2·3 | 2·3 | 0·2 | 3·1 | 1·8 | 2·8 | 1·1 | 1·5 | 21·2 | 7·9 |
| අනෙකුත් සමාගම් .. | 0·3 | 1·6 | ... | — | — | 0·1 | — | — | — | — | — | — | — | — | 2·0 | 0·7 |
| පුද්ගලයන්, සමාජ සහ ආයතන .. .. | — | 0·1 | 1·1 | 0·6 | 0·2 | 0·5 | 2·9 | 0·1 | 1·0 | 0·1 | — | 0·7 | 0·2 | 0·4 | 7·9 | 2·9 |
| එකතුව .. | 9·6 | 5·8 | 20·8 | 23·9 | 25·0 | 25·0 | 35·0 | 25·0 | 25·0 | 5·8 | 2·0 | 42·7 | 4·1 | 20·0 | 269·6 | 100·0 |

* 1955/60 කල්පිරෙන 2½% ජාතික සංවර්ධන ණය පවරාදීමෙන් ආයෝජනය කැරුණු අළුත් ණය.
+ 1959/60 කල්පිරෙන 3½% ණය පවරාදීමෙන් ආයෝජනය කැරුණ අළුත් ණය.

සංඛ්‍යා - ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

අනිත් නිකුතු හය එනම්, 1960 දෙසැම්බර් මාසයේ දී නිකුත් කැරුන 1981 - 85, $4\frac{1}{4}$% "බී" කාණ්ඩයේ ණය, 1961 ජනවාරියේදී නිකුත් කැරුන 1982 - 86, $4\frac{1}{4}$% ණය 1961 පෙබරවාරි මාසයේදී නිකුත් කැරුන 1982-86 සියයට $4\frac{1}{4}$ "බී" කාණ්ඩයේ ණය, 1961 මැයි මාසයේදී නිකුත් කැරුන 1982 - 86, $4\frac{1}{4}$% "සී" කාණ්ඩයේ ණය 1961 ජූලි මාසයේදී නිකුත් කැරුන 1982-86 "ඩී" කාණ්ඩයේ ණය හා 1961 සැප්තැම්බර් මාසයේදී නිකුත් කැරුන 1982 - 86 $4\frac{1}{4}$% "එෆ්" කාණ්ඩයේ ණය, හුදෙක් මුදල් ලබා ගැනීම සඳහා නිකුත් කැරිණි. මේ නිකුතු හයේ සම්පූර්ණ මුදල වන රුපියල් කෝටි 26·96 මුළුමණින්ම එකතු විය. සුරැකුම්පත් බෙදීගිය අයුරු II-47 සටහනින් දැක්වේ.

## භාණ්ඩාගාර බිල්පත්

කලින් මුදල් වර්ෂ දෙකේදී මෙන්ම 1960 - 61 දී ද වැඩි වූ රාජ්‍ය ණයෙන් විශාලම කොටස භාණ්ඩාගාර බිල්පත් වලින් සමන්විත විය. 1960 සැප්තැම්බර් අවසානයේදී රුපියල් කෝටි 55·0 ක් වූ තොගෙවා ඇති භාණ්ඩාගාර බිල්පත් 1961 සැප්තැම්බර් අවසාන වනවිට රුපියල් කෝටි 75·0 තෙක් වැඩි විය. වැඩි වූ භාණ්ඩාගාර බිල්පත් වලින් විශාල කොටසක් මහ බැංකුව විසින් ගනු ලැබිය.

1960 - 61 මුදල් වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත් සඳහා බලය ලත් සීමාව පාර්ලිමේන්තු යෝජනා සම්මුතියකින් 1961 ජූනි 8 වැනි දින රුපියල් කෝටි 65·0 සිට රුපියල් කෝටි 75·0 තෙක් වැඩි කරන ලදී.

## විදේශීය ණය ගැනීම්

විදේශීය ණය ගිවිසුම් යටතේ රුපියල් කෝටි 1·63 ක් ලැබිණි. ණය බේරීම් වශයෙන් ජාත්‍යන්තර සංවර්ධන හා ප්‍රතිසංස්කරණ බැංකුවට රුපියල් කෝටි 0·25 ක් ද සංවර්ධන ණය අරමුදලට රුපියල් කෝටි 0·04 ක් ද ගෙවන ලදී. මේ අනුව රුපියල් කෝටි 1·34 කින් විදේශීය ණය (දළ) වැඩි විය.

විදේශීය ණය ලබාගත් මාර්ගයන් බෙදා වෙන්කොට පහත සටහනේ දැක්වේ.

සංඛ්‍යා සටහන—II—48

**විදේශීය ණය ගැනීම්**

රුපියල් දශ ලක්ෂ

| | |
|---|---|
| ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුව .. .. | 11·7 |
| ජාත්‍යන්තර සමූපකාර පරිපාලන ආයතනය (එක්සත් ජනපදය) .. .. | 0·8 |
| එක්සත් ජනපදයේ සංවර්ධන ණය අරමුදල .. .. | 2·0 |
| එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව .. .. .. | 1·8 |
| | 16·3 |
| ආපසු ගෙවූ ණය හැර .. .. .. | — 2·9 |
| | 13·4 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහබැංකුවෙනි

## නිදන් අරමුදල්

1960-61 මුදල් වර්ෂය අවසාන වන විට රාජ්‍ය ණය බේරීම් සඳහා වූ නිදන් අරමුදලේ වටිනාකම රුපියල් කෝටි 31·83 ක් විය. 1959 - 60 සංඛ්‍යාව අනුව සසඳන විට මෙය රුපියල් කෝටි 0·08 ක වැඩිවීමෙකි. 1960 දී කල් පිරුන 1955-60, $2\frac{1}{2}$% ජාතික සංවර්ධන ණය ආපසු ගෙවීම සඳහා රුපියල් කෝටි 3·52 ක්

ආපසු ලබා ගන්නා ලදී. 1960 - 61 දී තිදන් අරමුදල් වලට අය – වැය ලේඛනයෙන් රුපියල් කෝටි 3·28 ක් වෙන් කැරිණි. ආයෝජන වලින් ලද පොලිය රුපියල් කෝටි 1·12 ක් විය. නිදන් අරමුදල් සතු ආයෝජන වල වෙළෙඳ වටිනාකම අනුව රුපියල් කෝටි 0.79 ක පොත් අලාභයක් ඇතිවිය.

### අර්ධ රාජ්‍ය නියෝජ්‍යත්වයන් විසින් ගත් ණය

1960 – 61 දී ජාතික නිවාස ණයකර නිකුතුවක් නොවිණි. එහෙත් 1961 ජූනි මාසයේදී රජය ජාතික නිවාස කොමසාරිස්ට රුපියල් කෝටි 1·0 ක අවක්‍රණයක් දෙන ලදී. මේ සමග මෙතෙක් කොමසාරිස්ට රජයෙන් දෙන ලද මුළු අවක්‍රණය රුපියල් කෝටි 3 0 ක් විය. නිකුත් කළ හා නොබේරූ ජාතික නිවාස ණය රුපියල් කෝටි 7·0 ක්ව පැවැතිණි ජාතික නිවාස ණය බේරීම සඳහා පිහිට වූ නිදන් අරමුදලේ නියම වෙළෙඳ වටිනාකම මුදල් වර්ෂය අවසානයේදී රුපියල් කෝටි 1.18 විය.

1961 ජනවාරි මාසයේදී රජයේ උකස් බැංකුව රුපියල් කෝටි 0·5 ක ණයකරයක් නිකුත් කළේය. බැංකුව සිය කටයුතු සඳහා තවදුරටත් වෙළෙඳ බැංකු වලින් අයිරා පහසුකම් ලබා ගත්තේය. උකස් බැංකුවට ගත හැකි උපරිම ණය ප්‍රමාණය 1959 – 60 දී රුපියල් කෝටි 5·0 ක් වුව ද, 1961 මැයි මාසයේදී රජයේ උකස් බැංකු පනතේ 35 වැනි වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් මේ සීමාව රුපියල් කෝටි 6·0 දක්වා වැඩි කරන ලදී. 1961 – 9 – 30 වැනි දිනට නිකුත් කළ හා නොබේරූ ණය රුපියල් කෝටි 4·58 ක් වූ අතර සහතික කළ හා නොබේරූ අයිරාවන් රුපියල් කෝටි 0·93 ක් විය.

### 1961 – 62 අය වැය ලේඛනය

1961 - 62 මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තුවෙන් සම්මත වූ මූල් ආදායම් සහ වියදම් ඇස්තමේන්තු මෙසේය:–

සංඛ්‍යා සටහන—11—49

**1961 - 62 මුල් අය - වැය ඇස්තමේන්තු**

රුපියල් දශ ලක්ෂ

| | | |
|---|---|---|
| ආවර්තන වියදම් (වැය ශීර්ෂ 1 - 2 - 4 සහ 6 | 1,623·3 | |
| $2\frac{1}{2}$% ඌනක වියදම් හැර | - 40·6 | 1,582·7 |
| ප්‍රාග් ධන වියදම් (අය-වැය ලේඛන) (වැය ශීර්ෂ 3,5 සහ 7) | 615·8 | |
| 15% ඌනක වියදම් හැර | - 92·4 | 523·4 |
| මුළු වියදම | | 2,106·1 |
| මුළු ආදායම | | 1,776·7 |
| ඇස්තමේන්තු අයවැය හිඟය | | 329·4 |
| නිදන් අරමුදල් දීමනා හැර | | - 48·9 |
| ඇස්තමේන්තු ශුඪ අය-වැය හිඟය | | 280·5 |

සංඛ්‍යා:–ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

හිඟය පියවීම සඳහා මුදල් ඇමතිවරයා විසින් දේශීය වෙළෙඳ පොළෙන් රුපියල් කෝටි 15·1*ක ණයක ද විදේශීය ආධාර වලින් රුපියල් කෝටි 14·0 ක් ද ගැනීමට අපේක්ෂා කරන ලදී.

* මුදල් ඇමතිවරයා ප්‍රකාශිත ප්‍රමාණය රුපියල් කෝටි 20·0 කි රුපියල් කෝටි 15·11 සංඛ්‍යාව ලැබුනේ රුපියල් කෝටි 4·89 ක් වූ නිදන් අරමුදල් දායක දීමනා මෙයින් අඩු කිරීමෙනි. ඊට හේතුව ශුද්ධ අය වැය හිඟය ගණනය කිරීමේදී නිදන් අරමුදල් දායක දීමනා වියදම් වශයෙන් ගණන් නොගැනීමය.

## ආදායම

මූල් ඇස්තමේන්තු අනුව 1961 - 62 ආදායම රුපියල් කෝටි 177·67 කි. මෙයට 1961 -- 62 අය වැය ලේඛනයෙන් පැන වූ අලුත් බදු වලින් ලැබෙතැයි ඇස්තමේන්තු කළ රුපියල් කෝටි 17·5 කට ආසන්න මුදලක් ද ඇතුළත් වෙයි. අලුතෙන් පැන වූ බදු වලට, ප්‍රධාන වශයෙන් රුපියල් කෝටි 2·5 ක් ලැබෙතැයි ඇස්තමේන්තු කළ ජාතික සංවර්ධන බද්ද, රුපියල් කෝටි 4·5 ක් ලැබෙතැයි ඇස්තමේන්තු කළ විකුණුම් බද්ද, රුපියල් කෝටි 3·67 කට ඇස්තමේන්තු කළ ස්වයං සේවක ලියා පදිංචි කිරීමේ බද්ද රුපියල් දශ ලක්ෂයක් ලැබෙතැයි ඇස්තමේන්තු කළ නියමිත සීමාවකට වැඩි ආදායම් සඳහා පැන වූ 100% ක අධිබද්ද ද මෙරටට ගෙන්වන හා මෙරට නිපදවන මත්පැන් හා දුම්කොළ වෙනුවෙන් පැන වූ අධි බද්ද ද ඇතුළත් වෙයි. මෙයට අමතරව වස්තු, ඉඩම්, හා ආදායම් බදු පුළුල් වන සේ සංශෝධන කිරීමෙන් ඒ බදු වලින් ලැබෙන ආදායමේ වැඩිවීමක් වෙතැයි බලාපොරොත්තු වනු ලැබේ. ස්වකීය සේවාවෙහි යෙදෙන්නවුන් ලියා පදිංචි කිරීමේ බද්ද පැන වූයේ ව්‍යාපාර නාම ලියා පදිංචි කිරීමේ බද්ද හා වෘත්තීය බද්ද වෙනුවටය.

දැනට පෙනී යන පරිදි 1960 - 61 නියම ආදායම මුලින් ඇස්තමේන්තු කළ ප්‍රමාණය වන රුපියල් කෝටි 177·67 ට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය හැකිය. තේ හා රබර් වෙළෙඳ පොළෙහි පිරිහීම මේවායින් ලැබෙන ආදායම් අඩුවීමට හේතු විය හැකිය. එසේම ආනයන සඳහා පැන වූ අධික බදු හා පාලනයන් නිසා ආනයන බදු ආදායම මඳක් අඩු වේ යැයි බලාපොරොත්තු වනු ලැබේ. පරිපාලන දුෂ්කරතාවන් නිසා අලුත් බදු වලින් බලාපොරොත්තු වන තරම් ආදායමක් නොලැබීයාමට හැකිය. රුපියල් කෝටි 4·5 ක් ලැබෙතැයි ඇස්තමේන්තු කළ විකුණුම් බද්ද තවම පනවා නොමැත

## වර්තන වියදම

1961 - 62 වර්ෂය සඳහා ඇස්තමේන්තු කොට ඇති වර්තන වියදම (වැය ශීර්ෂ 1 - 2 - 4 සහ 6 එකතුව) 2½% ක ඌන වියදමක් අත්හැරීමෙන් පසු රුපියල් කෝටි 158·47 ක් වෙයි. රුපියල් කෝටි 4·89 ක් වන නිදන් අරමුදල් දායක දීමනා සහ ආවර්තන වියදම් වල ප්‍රාග් ධන ශීර්ෂ වලින් එකතුවන රුපියල් කෝටි 8·35 ක් මෙයින් අඩු කළ විට මුළු වර්තන වියදම රුපියල් කෝටි 145·03 ක් වෙයි. මේ සංඛ්‍යාව මූල් ඇස්තමේන්තුවලට වඩා රුපියල් කෝටි 1·37 කින් අඩුය. 1960 - 61 නියම වියදම්වලට වඩා රුපියල් කෝටි 3·04 කින් අඩුය. සමාජ සේවා සඳහා ඇස්තමේන්තු කොට ඇති වියදම 1960 - 61 මුල් ඇස්තමේන්තුවලට වඩා රුපියල් කෝටි 2·05 කින් වැඩිය. මුළු වර්තන වියදම් පහළ වැටීමට හේතු වූයේ ආහාර ආධාරය අඩුවෙන් ඇස්තමේන්තු කිරීමය. මෙය පිටි සහ සුදු සීනිවල සිල්ලර මිල වැඩිකිරීම නිසාත් සීනි ගන්නා මිල අඩුවීම නිසාත් රුපියල් කෝටි 17.14 ක් වෙතැයි බලාපොරොත්තු වනු ලැබේ. 1960 - 61 ආහාර ආධාරය රුපියල් කෝටි 24·8 ක් විය.

**ප්‍රාග්ධන වියදම්**

ඌණන වියදම් සඳහා 15% ක් අත්හළ පසු මුළු ප්‍රාග්ධන වියදම් මුල් ඇස්තමේන්තු අනුව (වැය ශීර්ෂ 3, 5 සහ 7 එකතුව) රුපියල් කෝටි 52·34 ක් වෙයි. ආවර්තන වැය ශීර්ෂයන්හි ප්‍රාග්ධන ශීර්ෂවලින් රුපියල් කෝටි 8·35 ක් සහ අයි අය – වැය ලේඛන ප්‍රාග්ධන වියදම් වන රුපියල් කෝටි 3·36 ක් මෙයට එකතු කළ විට රජයේ මුළු ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 64·05 ක් වෙයි. මෙය මුල් ඇස්තමේන්තුවල ප්‍රාග්ධන වියදම්වලට වඩා රුපියල් කෝටි 11·76 කින් වැඩිය. 1960 – 61 නියම ප්‍රාග්ධන වියදමට වඩා රුපියල් කෝටි 12·51 කින් වැඩිය. 1960 – 61 මුල් ඇස්තමේන්තු හා සසඳන විට වියදම වැඩි වී තිබෙන්නේ අධ්‍යාපනය, නිවාස, ආර්ථික සේවා, වරාය සංයුක්ත මණ්ඩලය, ගමනාගමන මණ්ඩලය, රජයේ සමායතන වලට දෙන ලද ණය ආදිය සම්බන්ධයෙනි.

**අය වැය හිඟය පියවීම**

දේශීය ණය ගැනීම් වලින් ලැබෙතැයි ඇස්තමේන්තු කළ රුපියල් කෝටි 20·0 මැදි කාලීන හා දිගු කාලීන ණය ගැනීම් වලින් ලබා ගන්නා බව සිතිය හැකිය. මෙය 1960 – 61 දී රජයේ රුපියල් සුරැකුම් පත් නිකුත් කිරීමෙන් බැංකු හා බැංකු නොවන ආයෝජකයන්ගෙන් ලබා ගත් රුපියල් කෝටි 21.5 ක නියම ආදායම හා මැනවින් සැසඳේ. මුදල් වර්ෂයේ මුල් පස් මාසය තුළදී මැදි කාලීන හා දිගු කාලීන ණය වලින් ලැබුන මුදල රුපියල් කෝටි 6·5 ක් පමණ විය.

රුපියල් කෝටි 14.0 කට ඇස්තමේන්තු කළ විදේශීය ආධාර වලින් රුපියල් කෝටි 12·3 ක් දැනට ගිවිස ගෙන ඇති ගිවිසුම් මගින් ලැබේ යැයි අදහස් කෙරේ. මෙයට අවක්‍ර විදේශීය ආධාර වලින් ලැබෙන රුපියල් කෝටි 11·5 ක් සහ එක්සත් ජනපද ප්‍රතිපාර්ශ්වීය අරමුදලෙන් ලැබෙන රුපියල් කෝටි 0·8 ක් ඇතුළත්ය.